# ගෝවා වගාව

## රෝග හා පළිබෝධ හඳුනාගැනීම හා මර්ධනය කිරීම



## රූපමය කාඩ් පත්

ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක සහ පොහොර
ආරක්ෂාකාරීව සහ නිවැරදි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

www.safe.doa.gov.lk



# ගෝවා වගාව රෝග හා පළිබෝධ හඳුනාගැනීම හා මර්ධනය කිරීම

## තාක්ෂණික දායකත්වය

- එච්. ඒ. එස්. එන්. හෙට්ටිආරච්චි - කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, සීතාඑළිය
- කේ. පුෂ්පාංජී - කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, සීතාඑළිය
- ආචාර්ය පී. එච් රණවීර - උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව
- ටී. කේ. ඒ. අයි. හජ්ජී - ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල
- එම්. එස්. ඩබ්. ප්‍රනාන්දු - උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව
- ආචාර්ය ජේ. පී. මාරසිංහ - පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය, පේරාදෙණිය

## සැකසුම

- පී. එස්. පී. තෙන්නකෝන් - ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නෝරුව
- කේ. ඒ. යු. එන්. එන්. බණ්ඩාර - ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නෝරුව




කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය
2024

# දියමන්ති පිටැති සලබයා



### හානිවූ පත්‍ර

කීටයන් පත්‍ර ආහාරයට ගැනිම නිසා අක්‍රමවත් සිදුරු ඇතිවේ. හානිය අධික වු විට පත්‍ර නාරටි පමනක් ඉතිරි විය හැක.



### කීටයා

නොමේරූ කීටයන් ලා කහ පැහැති වේ. වැඩුණු කීටයා මි.මී. 5-8 පමණ වන අතර ලා කොල පැහැති ය. සමහර අවස්ථාවලදී සේද නුලකින් පත්‍රයේ සිට පහළට එල්ලෙමින් සිටී.



### පිළා කෝෂය

කහ පැහැති කෝෂය මි.මී. 7-9 පමණ දිග වේ. පහළ හෝ පිටත පත්‍ර මත ලිහිල් සේද කොපුවක් තුළ කෝෂ ගතවීම සිදු වේ.



### සුහුඹුල් සලබයා

මි.මී. 6 ක් පමණ දිගකින් යුක්ත වේ. පිට දිගේ දියමන්ති ආකාර ක්‍රීම් හෝ ලා දුඹුරු පැහැති පටියක් දක්නට ඇත. රාත්‍රියේදී වඩා ක්‍රියාකාරී වේ.

# දියමන්ති පිටැති සලබයා

## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| ෆ්ලුබෙන්ඩියාමයිඩ් 24% WG | ග්‍රෑම් 06 |
| ස්පිනොසැඩ් 25 g/l SC | මි.ලී. 16 |
| ස්පිනෙටොරාම් 25% WG | ග්‍රෑම් 04 |
| ක්රෝරන්ට්‍රිනිලිප්‍රෝල් 200 g/l SC | මි.ලී. 03 |
| ලුෆෙනියුරෝන් 50 g/l EC | මි.ලී. 16 |
| නොවැලුරෝන් 100 g/l EC | මි.ලී. 20 |
| ඉන්ඩොක්සාකාර්බ් 150 g/l EC | ග්‍රෑම් 6.4 |
| ඇසඩිරැක්ටින් - ඒ 7.5 g/l EC | මි.ලී. 80 |
| ක්ලෝෆ්ලූවසියුරෝන් 50 g/l EC | මි.ලී. 16 |
| එටොෆෙන්ප්‍රොක්ස් 100 g/l EC | මි.ලී. 24 |
| බිස්ට්‍රිෆ්ලියුරෝන් 100 g/l EC | මි.ලී. 24 |
| ටෙබුෆෙනොසයිඩ් 200 g/l SC | මි.ලී. 24 |

## වෙනත් පාලන ක්‍රම

- වගා ක්ෂේත්‍රය වටා කෘමි බාධක දැලක් ගැසීම හෝ බාධක වැටක් ඉදිකිරීම
- විසුරුම් ජලසම්පාදනය භාවිතා කිරීම
- නිර්දේශිත ප්‍රමාණයට කාබනික හා රසායනික පොහොර භාවිතා කිරීම
- සලබයන් විකර්ෂණය සඳහාම නිපදවා ඇති විශේෂිත කහ පැහැති බල්බ ඇටවුම භාවිතා කිරීම
- කොහොඹ නිස්සාරකය භාවිතා කිරීම

## වළක්වා ගැනීම

- වගාව ස්ථාපනයට පෙර, පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්නම් විනාශකර දැමීම
- ක්ෂේත්‍රයේ හා ක්ෂේත්‍රය අවට හොඳින් වල් මර්දනය සිදු කිරීම
- තවාන් නිරන්තර පරීක්ෂාව මගින් බිත්තර සහ කීටයන් හමු වුවහොත් කොළ හෝ සම්පූර්ණ ශාකයම ඉවත් කර විනාශ කිරීම
- බාහිරින් පැළ ලබාගන්නේ නම් හානියෙන් තොර පැළ ලබා ගැනීම

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# අඩපුඩු දළඹුවා



### හානි වූ ශාකයක්

දළඹුවන් පත්‍ර ආහාරයට ගැනීම නිසා විශාල සිදුරු ඇතිවේ. හානිය අධික වු විට පත්‍ර නාරටිය පමණක් ඉතිරිවේ. පත්‍ර පාමුල දළඹුවන්ගේ අපද්‍රව්‍ය විශාල වශයෙන් දැකිය හැකිය.



### දළඹුවා / කීටයා

වැඩුනු කීටයන් සෙ.මී. 3 - 4 පමණ දිග කොළ පැහැතිය. ශරීරය දෙපස සුදු ඉරක් දැකිය හැක. ,  ගමන් කරන විට ලූපයක් / අඩ පුඩුවක් සාදයි.



### පිළා කෝෂය

පත්‍රවල යටි පැත්තේ, තුනී විනිවිද පෙනෙන කොපුවක් තුළ කෝෂ ගතවේ. මුල් අවස්ථාවේදී කෝෂය කොළ පැහැ වන අතර  පසුව තද දුඹුරු හෝ කළු පැහැයක් ගනී. දිග සෙ.මී. 2 - 2.5  ක් පමණ වේ.



### සුහුඹුල් සලඹයා

සෙ.මී. 2.5 ක් පමණ දිගය. අළු-දුඹුරු පුර්ව පියාපතෙහි සුදු පැහැ වකුගඩු හැඩති කුඩා පැහැදිලි සලකුණු ඇත. රාත්‍රියේදී ක්‍රියාකාරීවේ.

# අඩපුඩු දළඹුවා



## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| එටොෆෙන්ප්‍රොක්ස් 100 g/l EC | මි.ලී. 24 |
| එටමෙක්ටින් බෙන්සොඒට් 5% SG | ග්‍රෑම් 6.4 |
| ක්ලෝෆ්ලූවසියුරෝන් 50 g/l EC | මි.ලී. 16 |
| බිස්ට්‍රයිෆ්ලූරෝන් 100 g/l EC | මි.ලී. 24 |
| ටෙබුෆෙනොසයිඩ් 200 g/l SC | මි.ලී. 24 |
| නොවැලුරෝන් 100 g/l EC | මි.ලී. 20 |
| ඉන්ඩොක්සාකාර්බ් 150 g/l EC | ග්‍රෑම් 6.4 |
| ක්ලෝරන්ට්‍රිනිලිප්‍රෝල් 200 g/l SC | මි.ලී. 03 |

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න



## වෙනත් පාලන ක්‍රම

- දළඹුවන් අතින් එකතු කර විනාශ කිරීම
- වගා ක්ෂේත්‍රය වටා කෘමි බාධක දැලක් ගැසීම හෝ බාධක වැටක් ඉදිකිරීම
- නිර්දේශිත ප්‍රමාණයට කාබනික හා රසායනික පොහොර භාවිතා කිරීම
- සලබයන් විකර්ෂණය සඳහාම නිපදවා ඇති විශේෂිත කහ පැහැති බල්බ ඇටවුම භාවිතා කිරීම
- කොහොඹ නිස්සාරකය භාවිතා කිරීම

## වළක්වා ගැනීම

- වගාව ස්ථාපනයට පෙර, පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්නම් විනාශකර දැමීම
- ක්ෂේත්‍රයේ හා ක්ෂේත්‍රය අවට ප්‍රදේශයේ වල් පැලෑටි මර්ධනය කිරීම
- තවාන් පැළ නිරන්තර පරීක්ෂාව මඟින් බිත්තර සහ කීටයන් හමු වුවහොත් එම පත්‍ර හෝ සම්පූර්ණ ශාකයම ඉවත් කර විනාශ කිරීම
- බාහිරින් පැළ ලබාගන්නේ නම් හානියෙන් තොර පැළ ලබාගැනීම

# කියත් පණුවා



### හානි වූ  පැලයක්

කීටයන් ලපටි ශාක මුලින්ම කපා දැමීම හා පත්‍ර කා දැමීමද සිදු කරයි. මුල් වලටද හානි කරන අතර එවිට ශාක මැලවී යයි.  කපා දමා ඇති පැල පාමුල පස හාරා බැලූ විට බොහෝ විට කීටයා සිටිනු දැකිය හැකිය.



### හානි වූ ශාකයක්

වැඩුන කීටයන් විශාල සිදුරු ලෙස පත්‍ර කා දමයි. ගෙඩියට ද රිංගා හානි කිරීමට හැකිය.

හානි කළ ගෙඩිවල කීටයාගේ අපද්‍රව්‍ය විශාල වශයෙන් දැකිය හැක.



### කීටයා  / පණුවා

වැඩුනු කීටයා ලා අළු, අළු දුඹුරු හෝ කළු පැහැති සෙ.මී. 5-7 පමණ දිග වේ. පසේ කෝෂ ගතවේ.



### සුහුඹුල් සලබයා

සුහුඹුලා සෙ.මී. 2-5 ක් පමණ වේ. ඉදිරිපස පියාපත් තද දුඹුරු පැහැයෙන් යුක්ත වන අතර කෙළවරෙහි ලා අක්‍රම-වත් කලාපයක් ඇත. රාත්‍රියේදී වඩාත් සක්‍රිය වේ.

# කියත් පණුවා



## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| ක්ලෝෆ්ලුවසියුරෝන් 50 g/l EC | මි.ලී. 16 |
| එටොෆෙන්ප්‍රොක්ස් 100 g/l EC | ග්‍රෑම් 24 |

*සාර්ථක ප්‍රතිඵල සඳහා පැළය වටා ඇති පසට සවස් කාලයේ යොදන්න.

## වෙනත් පාලන ක්‍රම

- කපා දමා ඇති පැළ අසළ පස තුල සැඟවී සිටින කීටයන් අතින් අහුලා විනාශ කිරීම

## වළක්වා ගැනීම

- වගාව ස්ථාපනයට පෙර, පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්තම් විනාශකර දැමීම
- ගැඹුරුට සී සෑම
- ක්ෂේත්‍රය තුල හා අවට වල් මර්ධනය කිරීම



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# කුඩිත්තන්









### හානි වූ ශාක

ශාකයේ ලපටි පත්‍ර වලින් යුෂ උරාබීම නිසා පත්‍ර රැලිගැසී වර්ධනය අඩු වේ. කුඩිත්තන්ගේ ස්‍රාවයන් මත දීලිර වැඩීම නිසා පත්‍ර මතුපිට කළු පැහැ වේ.

### කුඩිත්තන්

පත්‍ර යටි පැත්තේ පියාපත් සහිත හා රහිත අවස්ථා දැකිය හැකිය. මි.මී. 1-3 පමණ මෘදු ශරීරයකින් යුක්තය.  අළු-කොළ පැහැතිය. වියළි කාළගුණ තත්ව යටතේ බෝවීම සීඝ්‍රයෙන් සිදුවේ.

# කුඩිත්තන්



## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

- ✸ මෙම පළිබෝධකයාට නිර්දේශිත කෘමිනාශක නොමැත.

## වෙනත් පාලන ක්‍රම

- ❖ වගාවේ මුල් අවස්ථාවේදී ආසාදනය වුයේ නම් ආසාදනය වූ කොළ හෝ එම පැළ ඉවත් කිරීම
- ❖ *Aphidius ervi* නම් වූ ජෛව පාලකයා යොදා ගැනීම

## වළක්වා ගැනීම

- ❖ වගාව ස්ථාපනයට පෙර, පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්තම් විනාශකර දැමීම
- ❖ ක්ෂේත්‍රයේ හා ක්ෂේත්‍රය අවට ප්‍රදේශයේ වල් පැලෑටි මර්ධනය කිරීම
- ❖ කුඩිත්තන් ආසාදනය වී නොමැති පැළ සිටුවීමට භාවිතා කිරීම

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# මුල් කන පණුවා



### හානි වූ ශාකයක්

ශාක මැලවීම, වර්ධනය අඩුවීම සහ ලා කොළ පැහැති වීම පෙන්වයි. මුල පද්ධතිය සම්පූර්ණයෙන්ම විනාශ කරයි. පැළ ගලවා බැලූවිට පැළ මුලෙහි කීටයන් දක්නට ලැබේ.



### කීටයා

කීටයන් සුදු පැහැතිය. පාද රහිතය. මුලෙහි සහ අවට දක්නට ලැබේ. දිග මි.මී. 6-10 පමණ වේ.



### පිළා කෝෂය

පස තුලදී පිළවා බවට පත්වේ. මි.මී. 6-7 පමණ දිගය. රතු දුඹුරු පැහැතිය.



### සුහුඹුල් මැස්සා

සාමාන්‍ය ගෙමැස්සෙකු මෙන් පෙනෙන නමුත් ඊට වඩා කුඩාය. මි.මී. 5-7 පමණ දිගය.

# මුල් කන පණුවා



## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

- මෙම පළිබෝධකයාට නිර්දේශිත කෘමිනාශක නොමැත.

## වෙනත් පාලන ක්‍රම

- හානිය සහිත පැල කීට අවස්ථා සමඟම ක්ෂේත්‍රයෙන් ඉවත් කර පුළුස්සා විනාශ කිරීම
- අතිරේක මුල් සෑදීම දිරිමත් කිරීම සඳහා කඳ පා මුලට පස් ලං කිරීම

## වළක්වා ගැනීම

- ගැඹුරුට සී සෑම
- හොඳින් සකසන ලද කාබනික පොහොර යෙදීම
- බෝග (ගෝවා පවුලේ බෝග හා ලීක්ස් හැර) මාරුව සිදු කිරීම
- නිරෝගී ශක්තිමත් පැළ වගාව සඳහා යොදා ගැනීම



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# බරවා රෝගය









**ආසාදිත ශාකයක්**

ආසාදිත ශාක උෂ්ණාධික දිනවලදී මැල වේ.

**ආසාදිත වගාවක්**

ගස් වල වර්ධනය අඩාල වේ. ගෝවා ගෙඩි බවට පත්වීම අඩු වේ.

**ආසාදිත මුල්**

මුල අක්‍රමවත් ඉදිමුන ස්වභාවයක් පෙන්වයි.

**පසු අවස්ථාවේ ආසාදිත මුල්**

ඉදිමුන මුල පසුව කුණු වේ.

# බරවා රෝගය



## රසායනික පාලනය - නිර්දේශිත දිලීරනාශක

- මෙම රෝගය සඳහා නිර්දේශිත දිලීරනාශක නොමැත.

## වළක්වා ගැනීම

- පාංශු පී.එච්. අගය 6.5 සහ 7.2 අතර පවත්වා ගැනීමට අළුහුණු එක් කිරීම
- නිරෝගී පැල වගාව සඳහා යොදා ගැනීම
- ක්ෂේත්‍ර සනීපාරක්ෂාව පවත්වා ගැනීම
- සියලුම මෙවලම්, පාවහන් සහ උපකරණ පිරිසිදු කිරීම
- බෝග මාරුව (ගෝවා හෝ එම කුලයේ බෝග හැර කැරට් ලීක්ස්, බෝංචි සමඟ)
- ක්ෂේත්‍රයේ හා ක්ෂේත්‍රය අවට ප්‍රදේශයේ රෝගයේ ධාරක වල් පැළෑටි (වල් රාබු, වල් අබ) මර්ධනය කිරීම



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# ගෝවා මුදු පුල්ලි රෝගය









**ආසාදිත පත්‍රයක්**

**ආසාදිත පත්‍රයක්**

පත්‍ර මත කුඩා අළු / දුඹුරු පාට වළලු ආකාර රටාවක් සහිත පැල්ලම් නාරටි අතර හට ගනී.

**ආසාදිත පත්‍රයක්**

මෙම පැල්ලම් වල මැද ඉතා කුඩා අල්පෙනෙති තුඩවල් වැනි කළු පැහැති කුඩු ස්වභාවයක් දැකිය හැකිය.

**ආසාදිත ශාකයක්**

මෙම පුල්ලි විශාල වී ගෝවා පත්‍රයම වියලී යා හැකිය.

# ගෝවා මුදු පුල්ලි රෝගය



## රසායනික පාලනය - නිර්දේශිත දිලීරනාශක

| දිලීර නාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| හෙක්සාකොනසෝල් 50 g/l EC / SC | මි.ලී. 06 |
| ප්‍රොපිකොන්සෝල් 250 g/l EC | මි.ලී. 06 |
| ටෙබුකොනසෝල් 250 g/l EW / WG | මි.ලී. 06 |
| ඉපොක්සිකොනසෝල් 125 g/l SC | මි.ලී. 06 |

* අවශ්‍ය නම් අවම වශයෙන් දින 21 කට පසු යලි භාවිතා කලයුතුවේ.

## වළක්වා ගැනීම

- නිර්දේශිත පරතරයට පැල සිටුවීම
- විසිරුම් ජල සම්පාදනය භාවිතා නොකිරීම
- අස්වනු නෙලීමෙන් පසු අවශේෂ පුලුස්සා දැමීම
- බෝග මාරුව අනුගමනය කිරීම (ගෝවා හෝ එම කුලයේ භෝග හැර කැරට්, ලීක්ස්, බෝංචි සමඟ)

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න



# කළු කුණුවීමේ රෝගය









**මුල් අවස්ථාවේ ආසාදිත පත්‍රයක්**

පත්‍ර වල මායිමෙන් ආරම්භ වී මැද දෙසට විහිදෙන V අකුරක් හැඩැති කහ පැහැති පැල්ලම් ඇතිවේ.

**මැදි අවස්ථාවේ ආසාදිත පත්‍රයක්**

නාරටි කළු පැහැයට හැරෙයි.

**පසු අවස්ථාවේ ආසාදිත පත්‍රයක්**

දැඩි ලෙස බලපෑමට ලක්වූ පත්‍ර වියළී අකලට වැටී යයි.

**පසු අවස්ථාවේ ආසාදිත වගාවක්**

දැඩි ලෙස බලපෑමට ලක්වූ පත්‍ර වියළී අකලට වැටී යයි.

# කළු කුණුවීමේ රෝගය



## රසායනික පාලනය - නිර්දේශිත දිලීරනාශක

- ✸ මෙම රෝගය සඳහා නිර්දේශිත දිලීරනාශක නොමැත.

## වළක්වා ගැනීම

- ❖ නිරෝගී බීජ භාවිතා කිරීම
- ❖ භාවිතා කරන මෙවලම් සහ උපකරණ පිරිසිදු කිරීම
- ❖ ක්ෂේත්‍ර සනීපාරක්ෂාව පවත්වා ගැනීම
- ❖ අස්වනු නෙලීමෙන් පසු අවශේෂ පුලුස්සා දැමීම
- ❖ බෝග මාරුව අනුගමනය කිරීම (කැරට්, ලීක්ස්, බෝංචි වැනි බෝග සමඟ)



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# ගෙඩි කුණුවීමේ රෝගය









**මුල් අවස්ථාවේදී ආසාදිත ශාකයක්**

ගෙඩියට ආසන්න පත්‍රවල දුඹුරු පැහැති රවුම් පැල්ලම් ඇතිවේ.

**මැදි අවස්ථාවේදී ආසාදිත ශාකයක්** **මැදි අවස්ථාවේදී ආසාදිත ශාකයක්**

ගෙඩිය / පත්‍ර සුදු පැහැති පුළුන් වැනි දිලීරයකින් වැසීයයි. පසුව මෘදු වී කුණු වේ.

**පසු අවස්ථාවේ ආසාදිත ශාකයක්**

ගෙඩි මතුපිට කළු පැහැති කුඩා ඇට ආකාර ව්‍යුහ හටගනී.

# ගෙඩි කුණුවීමේ රෝගය



## රසායනික පාලනය - නිර්දේශිත දිලීරනාශක

- මෙම රෝගය සඳහා නිර්දේශිත දිලීරනාශක නොමැත.

## වළක්වා ගැනීම

- වගා භූමිය ගැඹුරට සීසා සති 2ක් සූර්යාලෝකයට නිරාවරණය වීමට ඉඩහැරීම
- වගාවට පෙර අළු හුණු යොදා පසේ pH අගය වැඩිකර ගැනීම
- නිර්දේශිත පරතරයට පැළ සිටුවීම
- පත්‍ර වියළී යාමට හැකිවන පරිදි උදෑසන ජල සම්පාදනය සිදුකිරීම
- ක්ෂේත්‍ර සනීපාරක්ෂාව පවත්වාගෙන යාම
- බෝග මාරුව සිදුකිරීම (ගෝවා, කැරට්, රාබු, බ්‍රෝකොලි, කෝලිෆ්ලවර් වැනි රෝගයට ගොදුරුවන බෝග හැර)



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# යටි පුස් රෝගය



**ආසාදිත පත්‍රයක උඩ පැත්ත**

පත්‍ර මතුපිට කහ පැල්ලම් හෝ අක්‍රමවත් හැඩැති තුවාල ඇතිවේ.



**ආසාදිත පත්‍රයක යටි පැත්ත**

පත්‍ර යටි පැත්තේ සුදු, දිලීර වර්ධනයක් දැකීමට හැකිය.



**ආසාදිත තවාන් පැළයක්**

දරුණු ආසාදන තත්වයකදී අකලට තවානේ පත්‍ර වැටේ. වර්ධනය අඩාල වේ.



**ආසාදිත ශාකයක්**

ඇතැම් අවස්ථා වල ක්ෂේත්‍රයේදී ශාකයේ පහළ පත්‍ර රෝගයට ගොදුරුවේ.

# යටි පුස් රෝගය



## රසායනික පාලනය - නිර්දේශිත දිලීරනාශක

| දිලීර නාශකය | ජලය ලීටර් 16 ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| කැප්ටාන් 50% WP | ග්‍රෑම් 32 |
| කැප්ටාන් 80% WG | ග්‍රෑම් 20 |
| මැන්කොසෙබ් 75% WG | ග්‍රෑම් 32 |
| මැන්කොසෙබ් 80% WP | ග්‍රෑම් 32 |
| මැනෙබ් 80% WP | ග්‍රෑම් 32 |

## වළක්වා ගැනීම

- තවානේදී බීජ නිසි පරතරයෙන් සිටුවීම
- ජලය බැස යන ආකාරයට තවාන සැකසීම
- පත්‍ර වියළී යාමට හැකිවන පරිදි උදෑසන ජල සම්පාදනය සිදුකිරීම
- තාවානේ ඇති රෝග ලක්ෂණ සහිත පැල ඉවත් කිරීම
- බීජ පැල වූ පසු නිර්දේශිත දිලීරනාශකයක් තවානට යෙදීම



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක සහ පොහොර
ආරක්ෂාකාරීව සහ නිවැරදි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

www.safe.doa.gov.lk